# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

## Primary Piriven Year End Term Test - 2015

4 වසර / Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**ත්‍රිපිටක ධර්මය**
**Thripitaka Dharmaya**

කාලය : පැය තුනයි
Time : Three hours

**I කොටසේ** ප්‍රශ්න සියල්ලටමත් II, III හා IV යන කොටස්වලින් **එක් ප්‍රශ්නයක්වත්** ඇතුළත් වන සේ ප්‍රශ්න **6 කට පමණක්** පිළිතුරු සපයන්න.

**I කොටස**

**01. කෙටි පිළිතුරු සපයන්න.**

i. බුද්ධ රත්නයේ ගුණ **හතරක්** ලියන්න.

ii. ධම්ම පදයේ වග්ග කීයද ? එය අයත් නිකාය ග්‍රන්ථය කුමක් ද?

iii. කෘත්‍ය වශයෙන් කර්මයේ ප්‍රභේද **හතර** ලියන්න.

iv. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ගිහි නම හා පැවිදි වූ පසු ලැබූ අගතනතුර කුමක්ද ?

v. සූත්‍ර පිටකයට අයත් නිකාය ග්‍රන්ථ පහකි. ඉන් **හතරක්** නම් කරන්න.

vi. **සතර ආරුප්ප** නම් කරන්න.

vii. ආර්ය ධන හතකි. ඉන් **හතරක්** නම් කරන්න.

viii. **පුබ්බ කරණ** නම් කරන්න.

ix. තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු **හතරක්** ලියන්න.

x. විරති චෛතසික කීයද ? ඒ මොනවාද ? (ලකුණු 4 x 10 = 40)

The National e-Learning Portal for The General Education

**II කොටස**

02. I "අභික්ඛෙය්‍යයං අභික්ඛාතං" ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

ii "ලෝකවිදූ" බුදු ගුණය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

03. i චරං චෙ නාධිගච්ඡෙය්‍ය .....

ii න තං කම්මං කතං සාධු .....

iii ධම්මපීති සුඛං සෙති ......

iv යථාපි රහදො ගම්භීරො ..... ඉහත සඳහන් ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න. (ලකුණු 06)

ii ඉන් එක් ගාථාවකට අදාළ නිදාන කථාව ලියන්න. (ලකුණු 06)

04. i බුද්ධාදී අටතැන සැකය දක්වන්න. (ලකුණු 04)

ii ත්‍රිලක්ෂණාවබෝධය භික්ෂු ජීවිතයක සාර්ථකත්වයට හේතුවන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 08)

05. i භික්ෂුන් වහන්සේගේ නොපිරිහීම සඳහා හේතු වන කරුණු **හතක් හිරි ගාරව සුත්‍රයේ** දක්වා ඇත. ඉන් **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

ii ''භික්ෂු සමගිය'' භික්ෂුන්ගේ උන්නතියට හේතුවන අයුරු ඔබට නියමිත සුත්‍ර ඇසුරෙන් විමසන්න. (ලකුණු 08)

## III කොටස

06. i පළමු ධර්ම සංගායනාවෙන් පසු පත්කරන ලද සුත්‍ර පිටකයේ භාරධාරී භාණක තනතුරු හතරක් නම් කරන්න. (ලකුණු 04)

ii ධර්මාශෝක රජතුමාගේ ශාසනික සේවය නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

07. සම්බුද්ධ ශාසනයේ පුනර්ජීවය උදෙසා අනගාරික ධර්මපාල තුමාගෙන් සිදුවූ මෙහෙය අගයන්න. (ලකුණු 12)

## IV කොටස

08. i භාවනා යෝගියාට බාධා කරන පලිබෝධ **දහය** නම් කරන්න. (ලකුණු 05)

ii විදර්ශනා භාවනාවෙන් කෙලෙස් ප්‍රහීනවන ආකාරය පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 07)

09. i **දෙපනස් චෛතසික** රාශිවලට බෙදෙන ආකාරය පෙන්වන්න. (ලකුණු 06)

ii කුසල චෛතසික පහළවීම යහපත් ක්‍රියා සිදුකිරීමට හේතුවන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

10. i සීමා විපත් එකොළොසකි. ඉන් **හතරක්** ලියන්න. (ලකුණු 04)

ii විනය කර්මයක් සිදුකිරීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 08)